# 10 දේව රාජ්‍යය

දේව රාජ්‍යය යනු

- දෙවියන් වහන්සේගේ පාලනයට නතුවීම යි
- පාපය ඉවත ලා දේව වරප්‍රසාදය තුළ ජීවත් වීම යි
- දේව අභිමතයට මිනිස් සමාජය නතු වීම යි
- ප්‍රේමය, සත්‍යය, යුක්තිය, සාධාරණත්වය හා ගුණ ධර්ම අනුව ජීවත් වීම යි

ජේසුස් වහන්සේ දේව රාජ්‍යය ප්‍රකාශ කළ සේක. උන්වහන්සේගේ වචන හා ක්‍රියාවල හරය වූයේ දේව රාජ්‍යයේ උදාව ය. දේව රාජ්‍යය උරුමකර ගැනීමට සියලු දෙනා ම කැඳවා ඇත. දේව රාජ්‍යය දිනා ගැනීමට කැපවීමෙන් කටයුතු කළ යුතු වෙමු. දේව රාජ්‍යය තුළ දැකිය හැකි වටිනාකම් ජේසුස් වහන්සේ උපමා මගින් ඉගැන්වූ සේක.

- වපුරන්නා පිළිබඳ උපමාව (ලූක් 8:5-8)
- නිධානය, මුතු ඇටය සහ දැල පිළිබඳ උපමා (මතෙව් 13:44-50)

## • වපුරන්නා පිළිබඳ උපමාව



10.1 රූපය - වපුරන්නා



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙම උපමාව මගින් දේව රාජ්‍යයේ වර්ධනයට ඇති බාධා සහ දේව වචනය පිළිබඳ ව තිබිය යුතු ආකල්ප විස්තර කරයි. අප දේව වචනයට සාවදානව ඇහුම්කන් දිය යුතු වෙයි. ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වයට විවෘත වන තරමට අප තුළ නව ජීවනයේ බීජ සරු ලෙස වර්ධනය වෙයි.

| බීජ වැටුණු බිම | බීජවලට සිදු වූ දේ | උපමාවේ විවරණය |
|---|---|---|
| මග දිගේ වැටුණු බීජ | කුරුල්ලෝ ඒවා අහුලා ගෙන කෑහ. | බීජ නමැති දේව වචනය සිත නමැති කෙතෙහි වැපුරු නමුදු යක්ෂයා ඇවිත් පැහැර ගනියි. |
| පස් නැති ගල් බිමේ වැටුණු බීජ | වහා පැළ වූ නමුත් හිරු නැගුණු විට මුල් නැති බැවින් වියළී ගියේ ය. | දේව වචනය සතුටින් පිළිගෙන ටික කලක් ඒ අනුව කටයුතු කර පරීක්ෂා කාලයෙහි දේව වචනය අමතක කර කටයුතු කරයි. |
| කටු අතර වැටුණු බීජ | කටු ගස් වැවී ඒවා යට කර දැමී ය. | දේව වචනය අසා ජීවිතයේ දුක් කම්කටොලුවලින් ද වස්තුවෙන් ද ඉඳුරන් පිනවීමෙන් ද වචනය යටපත් වීම නිසා කෙනෙක් ඵල නොදරති. |
| සරු බිමෙහි වැටුණු බීජ | එකකින් සිය ගුණයක් ඵල දැරී ය. | අවංක, පිරිසිදු සිතකින් වචනය අසා, පිළිපැද, නොපසුබට වීර්යයෙන් පල දරන අය වෙති. |

- **නිධානය පිළිබඳ උපමාව**



10.2 රූපය - නිධානය

> ස්වර්ග රාජ්‍යය, කෙතක සඟවා තිබුණු නිධානයකට සමාන ය. එක්තරා මිනිසෙකුට එය සම්බ විය. ඔහුත් එය සඟවා තබා, මහත් ප්‍රීතියෙන් ගොස් තමා සන්තක සියල්ල විකුණා ඒ කෙත මිල දී ගත්තේ ය.
>
> (මතෙව් 13:44)

මෙම උපමාව මගින් පෙන්වා දෙන්නේ දේව රාජ්‍යය ලබා ගැනීමට අප සතු සැම දේ ම පරිත්‍යාග කිරීමට අප සූදානම් විය යුතු බව ය. නිධානය සැඟවී ඇති කුඩා දෙයක් වුව ද එය ඉතා වටිනා මිල කළ නොහැකි දෙයකි. දේව රාජ්‍යය යනු විශාල ලෞකික රාජ්‍යයක් නොවුව ද එහි වටිනාකම තක්සේරු කළ නොහැකි දෙයක් බව අප අවබෝධ කර ගත යුතු ය.

- **මුතු ඇටය පිළිබඳ උපමාව**



10.3 රූපය - මුතු විකුණන වෙළෙන්දා

> ස්වර්ග රාජ්‍යය, අගනා මුතු සොයා ගිය වෙළෙන්දෙකුට සමාන ය. ඉතා අගනා මුතු ඇටයක් සම්බ වූ විට ඔහු ගොස් තමා සන්තක සියල්ල විකුණා එය මිලට ගත්තේ ය.
>
> (මතෙව් 13:45-46)

මෙම උපමාව මගින් අපට පෙන්වා දෙන්නේ ස්වර්ග රාජ්‍යයේ ඇති වටිනාකම යි. වෙළෙන්දා තමා සතු සියල්ල විකුණා අමිල වූ මුතු ඇටය මිල දී ගත්තේ එබැවිනි. ඒ අනුව දේව රාජ්‍යය සොයන්නෙකුට තමන් සතු දේ ත්‍යාග කිරීමේ අභියෝග පවතියි.

- **දැල පිළිබඳ උපමාව**



10.4 රූපය - මසුන් පිරුණු දැල

ස්වර්ග රාජ්‍යය වනාහි, මුහුදේ හෙළන ලද, සියලු වර්ගවල මසුන් හසු කර ගත් දැලකට සමාන ය. ඒ දැල පිරුණු කල, ධීවරයෝ එය වෙරළට ඇද, හිඳගෙන, හොඳ මසුන් භාජනවලට එකතු කොට නරක මසුන් ඉවත දමූහ. යුගායන්තයේ දී එසේ ම වන්නේ ය. දේව දූතයෝ නික්ම අවුත්, දැමිටුවන් කෙරෙන් අදැමිටුවන් වෙන් කොට, අදැමිටුවන් ගිනි උදුනෙහි හෙළන්නෝ ය. එහි වැලපීම ද දත්මිටි කෑම ද වන්නේ ය.

(මතෙව් 13:47-50)

ධීවරයන් විසින් පිරුණු දැල වෙරළට ඇද, හොඳ මසුන් භාජනවලට එකතු කොට නරක මසුන් ඉවත් කරන්නා සේ ම දේව රාජ්‍යයේ පැමිණීමත් සමග ම සිදු වන්නා වූ අවසාන විනිශ්චය හේතු කොට ගෙන දැමිටුවන්ගෙන් අදැමිටුවන් වෙන් කොට, ඔවුන්ට ලැබිය යුතු ඵල විපාක දෙනු ලබන බව මෙම උපමාව අපට උගන්වයි.

**ශුද්ධ වූ ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා**

- යහපත් සමාරියා පිළිබඳ උපමාව (ලූක් 10:25-37)
- නැතිවුණු පුත්‍රයා පිළිබඳ උපමාව (ලූක් 15:11-22)
- ධනපතියා සහ ලාසරස් පිළිබඳ උපමාව (ලූක් 16:19-31)

| උපමාවේ නම | ලැබෙන පණිවුඩය |
|---|---|
| යහපත් සමාරියා පිළිබඳ උපමාව | දේව රාජ්‍යයට හිමිකම ලැබෙන්නේ ජාති, කුල, ආගම් යනාදි භේද පසෙක දමා සැමට ප්‍රේම කරමින් සේවය කළ හොත් පමණි. |
| නැතිවුණු පුත්‍රයා පිළිබඳ උපමාව | තම පාපයන්ට මනස්තාප වී නැවත දෙවියන් වහන්සේ වෙත හැරී එන්නා දෙවියන් වහන්සේ සාදරයෙන් පිළිගෙන තම පුත්‍රභාවයෙහි ස්ථාපිත කරන සේක. |
| ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාව | ධනවත්කම නිසා සුඛෝපභෝගී ජීවිත ගත කරන අය දුප්පතුන් අමතක නොකළ යුතු ය. දේව රාජ්‍යය දිනා ගැනීමට නම් අසරණයන්ට පිහිට විය යුතු ය. අපට ලැබී ඇති හැකියා හා කුසලතා දියුණු කර ගෙන අන් අයගේ යහපත පිණිස යොමු කිරීම කිතුනු අපගේ වගකීම යි. |

**ක්‍රියාකාරකම**

1. දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ ව ඉගැන්වෙන උපමා පහක් නම් කරන්න.
2. ඉන් එක් උපමාවක් ලුහුඬින් ලියා එයින් ලැබෙන පණිවුඩය විස්තර කරන්න.

**ජීවිතයට බිඳක්**

- *දේව රාජ්‍යයේ ගුණාංග අප තුළ වර්ධනය කර ගනිමු.*